# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

## මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**(1997 අංක 20 දරන පනත යටතේ ස්ථාපිත කරන ලදී.)**

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

01. **තනතුරු නාමය** : **කළමනාකරණ සහකාර -III ශ්‍රේණිය (තාක්ෂණික නොවන)**

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : තනතුරු 07

**වැටුප් කේතය** : MA - 1-2

**වැටුප් පරිමාණය** : රු. 46,220-10X540 - 7X630- 12X1080 - 12X1280-84,350

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

**සුදුසුකම් :-**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම, සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර බඳවා ගැනීම**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන , අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ', සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැක.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල/දෙමළ

II. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04කට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම. සමග

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනයට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

අමතර සුදුසුකම් :-

(අ) දමිල භාෂාව කතාකිරීම, ලිවීම හා තේරුම් ගැනීමේ හැකියාව

(ආ) රජයේ, අර්ධ රජයේ හෝ වෙනත් පිළිගත හැකි ආයතනයක අලෙවි / ගිණුම්/ ප්‍රසම්පාදන හා පරිපාලන යන අංශ වල පළපුරුද්ද හා අමතර අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

02. **තනතුරු නාමය** : **අලෙවි සම්බන්ධීකාරක - III ශ්‍රේණිය**

(මෙම තනතුර පූර්ණකාලීනව ක්ෂේත්‍රගත රාජකාරියක් වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටී)

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව** : 01

**වැටුප් කේතය** : MA - 1-2

**වැටුප් පරිමාණය** : රු. 46,220-10X540 - 7X630- 12X1080 - 12X1280-84,350

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

**සුදුසුකම් :-**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම, සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම සහ

**අභ්‍යන්තර බඳවා ගැනීම**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන , අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ', සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැක.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල/දෙමළ

II. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04කට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම සමග

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර,එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනයට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

03. **තනතුරු නාමය** : **ක්ෂේත්‍ර ප්‍රවර්ධක (III ශ්‍රේණිය)**

(මෙම තනතුර පූර්ණකාලීනව ක්ෂේත්‍රගත රාජකාරියක් වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටී)

**පුරප්පාඩු සංඛ්‍යාව** : 02

**වැටුප් කේතය** : PL - 1

**වැටුප් පරිමාණය** : රු. 40,500 - 10X450 - 10X490 - 7X540- 15X590 -62,530

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

**සුදුසුකම් : -**

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06ක් සමත්වීම සමග අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්ද

අලෙවි සම්බන්ධීකාරක (III ශ්‍රේණිය) තනතුර හා ක්ෂේත්‍ර ප්‍රවර්ධක (III ශ්‍රේණිය) තනතුරු 02 සඳහා අවශ්‍ය අමතර සුදුසුකම් :

(අ) ක්ෂේත්‍රගත අලෙවි ප්‍රවර්ධන කාර්යන් සිදුකර තිබීම

(ආ) යතුරුපැදියක් හා යතුරුපැදි ධාවන බලපත්‍රයක් තිබීම

(ඇ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඇති හැකියාව

(ඇ) දමිල භාෂාව කතාකිරීම , ලිවීම හා තේරුම් ගැනීමේ හැකියාව

04. **පොදු කොන්දේසි :-**

I. **වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

II. **පත්වීමේ ස්වභාවය** : ස්ථිර පදනම මත බඳවා ගැනීමේදී, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

III. **වෙනත්** : සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

IV. **බඳවා ගැනීමේ ක්‍රමය** : ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරඟ විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල (වාචික / ලිඛිත හෝ ප්‍රායෝගික ඉදිරිපත් කිරීමේ පරීක්ෂණ) මත බඳවා ගනු ලැබේ.

V. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2025.07.04**

සියලු අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් දක්වන සහතික හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල, සහතික කරන ලද පිටපත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩල නිල වෙබ් අඩවියේ ඇතුළත් ආකෘතියට අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක් 2025.07.04 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. නැතහොත් අයදුම්පත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් හා පරිපාලන අංශයේ තබා ඇති පෙට්ටියට ගෙනවිත් බහාලිය යුතු වේ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

**අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.**